# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2324/18 - 2023 මාර්තු මස 21 වැනි අඟහරුවාදා - 2023.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත ( 460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : AMB/LD/1/AQ/48 (iv).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/97/PC/561.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර :*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 86ඩී තල්ගස්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කර ඇති මූලික පිඹුරු අංක 4449 හා 2023.01.19 දිනැති මූලික පිඹුරේ මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.0930 ක් වූ පහත සඳහන් පරිදි සවිස්තරව පෙන්නුම් කෙරෙන ඉඩම් කැබලි දෙක (02) :

01. කැබලි අංක 01
ඉඩමේ නම: තල්ගස්ගොඩබැද්ද; විස්තරය: ක්‍රීඩා පිටිය; හිමිකම් කියන අය: පී.එම්.එම්. ද සිල්වා ජයසිංහ, අංක 14, කිතුල්වත්ත පටුමඟ, බොරැල්ල, කොළඹ 08, සජිනි පවිත්‍රා ද සිල්වා ජයසිංහ, සොමි සෙවන, පියදිගම, ගිංතොට, ගාල්ල, සහන් චන්ද්‍රික මොහාන් ද සිල්වා ජයසිංහ; ප්‍රමාණය: හෙක්. 1.0593.

02. කැබලි අංක 02
ඉඩමේ නම: තල්ගස්ගොඩබැද්ද; විස්තරය: ප්‍රවේශ මාර්ගය; හිමිකම් කියන අය: පී.එම්.එම්. ද සිල්වා ජයසිංහ, අංක 14, කිතුල්වත්ත පටුමඟ, බොරැල්ල, කොළඹ 08, සජිනි පවිත්‍රා ද සිල්වා ජයසිංහ, සොමි සෙවන, පියදිගම, ගිංතොට, ගාල්ල, සහන් චන්ද්‍රික මොහාන් ද සිල්වා ජයසිංහ; ප්‍රමාණය: හෙක්. 0.0337.

ඉහත නම් සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.06.14 වැනි දින පෙ.ව. 9.00ට අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2023 මැයි මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශ්‍යතාවට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. ජී. හසන්ති නිරෝෂනී,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්ගොඩ.

2023 මාර්තු මස 14 වැනි දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0274




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/PHT/4/6/1/12.
*සංවාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2020/ WS/95.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 984 දරන බුටාවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කදාකුල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරවා, 2023.02.24 දිනැතිව අනුමත කරන ලද අංක ක.සි. 321171, කලාප අංක 01, පත්‍ර අංක 1 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන නාරංකඩුව වත්ත *හෙවත්* කාලියප්පෙරුමාල් වත්ත නමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0683 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: නාරංකඩුව වත්ත *හෙවත්* කාලියප්පෙරුමාල් වත්ත; හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්: (1.) බී. ජී. වර්ණකුලසූරිය, අංක 145, කදාකුල, තලාතුඔය, (2.) ආර්. එම්. බණ්ඩාර මැණිකේ මිය, අංක 145, කදාකුල, තලාතුඔය; ප්‍රමාණය: හෙක්. 0.0683. (පර්චස් 27)

*උතුරට* : කදාකුල (කොටසක්); *නැගෙනහිරට* : කදාකුල (කොටසක්); *දකුණට* : කදාකුල (කොටසක්); *බටහිරට* : කදාකුල (කොටසක්).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 මැයි මස 15 වැනි දින පෙ.ව. 10.00 ට පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023 මැයි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

එච්. කේ. සාගරිකා දිල්හානි,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට.

2023 මාර්තු මස 13 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.